# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2021
### 2024 සැප්තැම්බර්

### මානවශාස්ත්‍ර පීඨය

### නාට්‍ය හා රංගකලාව

### නූතන යුරෝපීය හා ඇමරිකානු නාට්‍ය කලාව DMAT – E3015

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. නූතන යුගයේ ලක්ෂණ හඳුන්වා දී, නූතන යුගය තුළ පැන නැගුණු දාර්ශනික කතිකාවන් මොනවාදැයි පෙන්වා දෙන්න.

    නැතහොත්

    "යුරෝපයෙහි නූතන යුගයේ ඇති වූ සමාජ, ආර්ථික සහ දේශපාලන විපරිණාමය ඉබ්සන්, ස්ට්‍රින්ඩ්බැරි සහ චෙකෝෆ්ගේ නාට්‍යවල තේමාත්මක සැකසුමට සවිඥානික බලපෑමක් කර ඇත." නිදසුන් සහිත ව විමසන්න.

02. පහත සඳහන් නාට්‍ය ශානරවල ලක්ෂණ උදාහරණ සහිත ව පෙන්වා දෙන්න.

    (අ) රෝමාන්තිකවාදය (Romanticism) (ආ) සුසාදිත නාට්‍ය (Well-made play)

    (ඇ) යථාර්ථවාදය (Realism) (ඈ) ඇබ්සර්ඩ් (Absurd)

03. චෙරිවත්ත (The Cherry Orchard) නාට්‍යයේ නිරූපිත චරිත සහ චෙරිවත්ත අතර ඇති අන්තර් සම්බන්ධතාවය ඔබ විග්‍රහ කරන්නේ කෙසේ ද? උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

04. හෙන්රික් ඉබ්සන්ගේ හෝ ආතර් මිලර්ගේ නාට්‍ය කෘතියක් උදාහරණ වශයෙන් ගෙන නූතන ට්‍රැජඩියේ (Modern Tragedy) ලක්ෂණ සහ ස්වභාවය පෙන්වා දෙන්න.

05. "එපික් රංගය (Epic Theatre) ප්‍රතිඇරිස්ටෝටලියානු (Anti – Aristotelian) රංගයකි." මෙම ප්‍රකාශය සම්බන්ධයෙන් ඔබේ මතය නිදසුන් සහිත ව සාකච්ඡා කරන්න.

06. සාන්දෘෂ්ටිකවාදී දර්ශනය (Existentialism) කෙටියෙන් හඳුන්වා දී සාන්දෘෂ්ටිකවාදී නාට්‍යයක එම දර්ශනය ප්‍රකට කෙරෙන අයුරු පෙන්වා දෙන්න.

07. ඇබ්සර්ඩ් රංගය (Theatre of the Absurd) වනාහි එයට ම අනන්‍ය ලක්ෂණ සහිතය. ඔබ විසින් කියවන ලද ඇබ්සර්ඩ් නාට්‍ය පිටපතකින් නිදසුන් දක්වමින් උක්ත අදහස පැහැදිලි කරන්න.

08. පහත සඳහන් නාට්‍යකරුවන් අතරින් දෙදෙනකු (02) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

    (අ) ඉයුජින් ඉස්කුයිබ්
    (ආ) හෙන්රි ආතර් ජෝන්ස්
    (ඇ) තෝන්ටන් වයිල්ඩර්
    (ඈ) ටෙනිසි විලියම්ස්
    (ඉ) හැරල්ඩ් පින්ටර්

********************************